**e-නැණ පියස වැඩ සටහන**

**දියමන්ති ව්‍යාපෘතිය**

**සාමාන්‍ය පාඩම් - 2**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම /ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 6.1.3. ජෝර්ජ් කිට් ශිල්පියාගේ නිර්මාණ අගයමු (II) |

**ඉගෙනුම් අත්වැල**

**ජෝර්ජ් කිට් ශිල්පියාගේ සිතුවම්**

- **මාර පරාජය**

ගෝතමී විහාරයේ සිතුවම් අතර වැදගත් නිර්මාණයකි.

හින්දු කලා ලක්ෂණ සහ පිකාසෝගේ ඝනිකවාදී කලා ලක්ෂණ මේ සඳහා ආභාසය වී ඇත.

ඝනිකවාදී හැඩතල තුළින් මාර සේනාවේ මුහුණුවල භයානක බව දක්වා ඇත.

මාර පිරිස - දුඹුරු ,අළු, කළු වැනි අඳුරු වර්ණ වලින්ද බුදුන් වහන්සේ - කහ ලා දුඹුරු වැනි වර්ණ වලින්ද වර්ණ කර ඇත.

වර්ණ වලින් ත්‍රිමාණ ලක්ෂණ දක්වා ඇත.

පරිපූර්ණත්වය හා නිමාව පෙන්වන නිර්මාණශීලී රේඛාකරණයක් යොදාගෙන ඇත.



- **නායිකා චිත්‍ර**

නායිකා චිත්‍ර ගණනාවක් ජෝර්ජ් කීට් විසින් ඇඳ ඇත.

තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වස් මත ඇඳ තිබේ.

නායිකා සිතුවම් අනුරාගී බවින් යුතු ප්‍රකාශනයන් ය. ඒ බව දැක්වීමට පුළුල් ඇස් සහ පුළුල් දෙතොල් යොදාගෙන ඇත.

එම සිතුවම්වල අලංකාරය හා ප්‍රකාශ න ශක්තිය තීව්‍ර කිරීම සඳහා රේඛා මනාව භාවිත කර ඇත.

කලා ආභාසය - බටහිර ඝනිකවාදී කලාව සහ හින්දු දර්ශනයේ තන්ත්‍රයාන ලක්ෂණ.

අඳුරු වර්ණ සහ පැහැදිලි දීප්තිමත් වර්ණ එකට සංකලනය කර වර්ණවත් කර ඇත.





**ක්‍රියාකාරකම**

1. මාර පරාජය සිතුවමේ තේමාව, කලා ආභාසය, වර්ණ භාවිතය සහ රේඛා භාවිතය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
2. නායිකා සිතුවම්වලට භාවිත කරන ලද මාධ්‍යය, හැඟීම් ප්‍රකාශනය,කලා ආභාසය, රේඛා භාවිතය සහ වර්ණ භාවිතය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

**පැවරුම - ජෝර්ජ් කීට්ගේ සිතුවම් පිළිබඳ වැඩිදුර තොරතුරු එක්රැස් කරන්න..**